# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,938/4 — 1970 දෙසැම්බර් 28 වැනි සඳුද — 1970.12.28

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදි.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

**1963 අංක 5 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත 1961 අංක 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ අංක 5 සී දරන ඡෙදයේ අංක (1) දරණ අනු ඡෙදයේ බලකල ප්‍රකාර නිකුත් කරන ආඥාවයි**

1963 අංක 5 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත 1961 අංක 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ අංක 5 බී දරණ ඡෙදයේ අංක (1) දරණ අනු ඡෙදයේ බලතල ප්‍රකාර 1964 ජනවාරි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පෙට්‍රල්, භූමිතෙල්, ඩීසල් සහ ද්‍රවිතෙල් ආනයනය හා අපනයනය කිරීමේ, විකිණීමේ, සැපයීමේ හෝ බෙදාහැරීමේ අයිතිය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත සම්පූර්ණයෙන්ම පවරන ලදින්,

ඉහත සඳහන් පනතේ අංක 5 සී දරණ ඡෙදයේ අංක 1 දරණ අනු ඡෙදයේ බලතල ප්‍රකාර එකී පනතේ අංක 5 බී දරණ ඡෙදයේ අංක (1) දරණ අනු ඡෙදයේ සඳහන් වර්ග හා විස්තරයන්ට අනුකූල පෙට්‍රෝලියම් නුවූවත් කවර අනෙක් පංතියකට හා විස්තරයකට අයත් පෙට්‍රෝලියම් වර්ගයන් වුවත් ආනයනය කිරීමේ, අපනයනය කිරීමේ, විකිණීමේ, සැපයීමේ හෝ බෙදාහැරීමේ අයිතිය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත සම්පූර්ණයෙන්ම පැවරීමට ගරු කර්මාන්ත හා විද්‍යා කටයුතු භාර ඇමති තුමාට බලතල ඇති හෙයින්,

කර්මාන්ත හා විද්‍යා කටයුතු භාර ඇමති, ටිකිරි බණ්ඩා සුබසිංහ වන මම, අභ්‍යවකාශයාවලට අවශ්‍ය ලිහිස්සි තෙල්, ග්‍රීස් ආදිය හැර අනෙකුත් සියලුම ලිහිස්සි තෙල් ග්‍රීස් වර්ග ආනයනය කිරීමේ, අපනයනය කිරීමේ, විකිණීමේ, සැපයීමේ හා බෙදාහැරීමේ අයිතිය 1971 ජනවාරි 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත සම්පූර්ණයෙන් පවරන බවට, මෙම ප්‍රකාශයෙන් අණ කරමි.

ටී. බී. සුබසිංහ,
කර්මාන්ත හා විද්‍යා කටයුතු භාර ඇමති.

1970.12.28 දින,
කොළඹ දිය.
එල්ඊ/ඒ/105
12–1353/1.

---

### ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

#### සතුකිරීමේ ආඥාව

1963 අංක 5 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 35 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කර්මාන්ත හා විද්‍යා කටයුතු භාර ඇමති, ටිකිරි බණ්ඩා සුබසිංහ වන මම, මෙම නියෝගයෙන් 1970 දෙසැම්බර් 29 වන දින සිට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතුකරමි.

(අ) උපලේඛනයේ අංක 1 දරන කොටසේ විස්තර වන ඉඩමේ නවතා ඇති ලියාපදිංචි අංක සී වී—6740 දරන ගුවන්යානා ඉන්දන තෙල් පුරවන ඇඳූ රථය සහ (මැත් බී–42) වර්ගයේ අංක ටී ආර්—1351 දරන ට්‍රැක්ටරය හා (ගැලුම් 2,400 ප්‍රමාණයේ) ට්‍රෙලරය හැර, මෙහි උපලේඛනයේ අංක 1, 2, 3, 4, 5 සහ 6 යටතේ විස්තර වන දේපලවල සෑම කොටසක් තුලම පිහිටි හෝ දක්නට ලැබෙන සියළුම චංචල හා නිශ්චල දේපල.

(ආ) මෙම උපලේඛනයේ අංක 1, 2, 3, 4, 5 සහ 6 හි විස්තර කරනු ලබන දේපල සම්බන්ධව එකඟවීමකින් හෝ විධිමත් හෝ අනියම් ගිවිසුමකින් හෝ බද්දකින් හෝ නොතාරිස් සහතික දරන නීත්‍යනුකූල ලියවිල්ලකින් හෝ 1070 දෙසැම්බර් 22 දිනට වලංගුව පවතින සාමූහික හෝ ඒකීය වශයෙන් පවතින සෑම අයිතිවාසිකම් සම්බන්ධකම් හා ප්‍රයෝජන ද වේ.

(ෂෙල් සහ එසෝ—කොලොන්නාව, බ්ලූමැන්ඩෝල් සහ දකුණු ජෙටිය)

(ඇ) බ්ලූමැන්ඩල්හි පොදු පහසුකම් තෙල් නල මාර්ග ඉපියා පෙට්ටිය පිහිටි ස්ථානයේ සිට මෙම උපලේඛනයේ 5 වැනි අංකයෙහි විස්තර කර ඇති බිම් කොටසේ නැගෙනහිර මායිමේ පිටත දක්වා පිහිටි සම්පූර්ණ නල මාර්ග එහි අඩංගු ඛනිජ තෙල් නිෂ්පාදන ඉපියා, ඉපියා කොටු නල නැමි යනාදිය.

(ඈ) කොළඹ වරායේ දකුණු ජෙටිය දක්වා ඇති මෙම උපලේඛනයේ 5 වෙනි අංශයේ විස්තර කර ඇති බිම් කොටසේ දකුණු මායිමේ පිටත දක්වා පිහිටි සම්පූර්ණ නල මාර්ග, එහි අඩංගු ඛනිජ තෙල් නිෂ්පාදන ඉපියා ඉපියා කොටු නල නැමි යනාදිය.

(ඉ) ඉහත (ඈ) කොටසේ සඳහන් කර ඇති නල මාර්ගවල ප්‍රයෝජනයට ගන්නා හෝ ප්‍රයෝජනයට ගැනීමට අදහස් කර ඇති සියළු නැවෙන සුළු නල.

(එසෝ—නල මාර්ග)

(ඊ) බලුමැන්ඩල් පොදු පහසුකම් තෙල් නල මාර්ග ඉපියා පෙට්ටිය පිහිටි ස්ථානයේ සිට මෙම උපලේඛනයේ 3 වන කොටසින් විස්තර කර ඇති බිම් කොටසේ නැගෙනහිර මායිමේ පිටත දක්වා පිහිටි සම්පූර්ණ නල මාර්ග, එහි අඩංගු ඛනිජ තෙල් නිෂ්පාදන ඉපියා ඉපියා කොටු නල නැමි යනාදිය.

(උ) කොළඹ වරායේ දකුණු ජෙටිය දක්වා ඇති උපලේඛනයේ 3 වෙනි කොටසේ විස්තර කර ඇති බිම් කොටසේ පහත දක්වා ඇති දේ හැර නැගෙනහිර මායිමේ පිටත දක්වා පිහිටි සම්පූර්ණ නල මාර්ග එහි අඩංගු ඛනිජ තෙල් නිෂ්පාදන ඉපියා ඉපියා කොටු නල නැමි යනාදිය වේ.

(i) දැනට සීමාසහිත තෙල් සමාගම විසින් ප්‍රයෝජනයට ගන්නා ගෑස් තෙල් ගෙන යන නල මාර්ග, එහි අඩංගු ඛනිජ ද්‍රව්‍ය, ඉපියා ඉපියා කොටු නල නැමි යන සම්පූර්ණ දේ.

(ii) දැනට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ප්‍රයෝජනයට ගන්නා ගෑස් තෙල් ගෙන යන නල මාර්ග, එහි අඩංගු ඛනිජ ද්‍රව්‍ය ඉපියා ඉපියාකොටු නල නැමි යන සම්පූර්ණ දේ.

(ඌ) ඉහත (ඊ) කොටසේ සඳහන් කර ඇති නල මාර්ගවල ප්‍රයෝජනයට ගන්නා හෝ ප්‍රයෝජනයට ගැනීමට අදහස් කර ඇති සියළුම නැවෙන සුළු නල.

(ෂෙල්—නල මාර්ග)

(එ) ඉහත කී (ඈ) සහ (උ) කොටස්වල විස්තර වන නල මාර්ගවලින් සහ කොළඹ වරායේ දකුණු ජෙටියෙහි පිහිටි ඉහත කී (ඌ) අංකයෙහි සඳහන් දැනට ෂෙල් සමාගම විසින් ගෑස් තෙල් ගෙනයෑමට යොදා ඇති නල මාර්ගයෙන්ද, එසේම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින්ද ගෑස් තෙල් ගෙනයෑමට යොදා ඇති නල මාර්ගයෙන්ද ආරම්භව පහත සඳහන් ස්ථානයන්හි කෙළවර වන සියලුම නල මාර්ග, ඒවායේ අඩංගු පෙට්‍රෝලියම් නිෂ්පාදන වර්ග, ඊට අයිති ඉපියා ඉපියා කොටු නල නැමි යනාදිය.

(අ) කොළඹ වරායේ දකුණු පාලම සහ නියමු පාලම

(ආ) විජය කුමරා පාලම දෙසට සවිකර ඇති නල මාර්ග අවසන් වන ඉපියා කොටුව.

(පොදු නල මාර්ගයන්)

(ඒ) මෙහි ඉහත (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ), (උ) සහ (ඌ) යන කොටස්වල විස්තර කරනු ලබන දේපල සම්බන්ධව එකඟවීමකින් හෝ විධිමත් හෝ අනියම් ගිවිසුමකින් හෝ බද්දකින් හෝ නොතාරිස් සහතික දරන නීත්‍යනුකූල ලියවිල්ලකින් 1970 දෙසැම්බර් 22 දින සාමූහික හෝ ඒකීය වශයෙන් පවතින සෑම අයිතිවාසිකම් සම්බන්ධකම් හා ප්‍රයෝජන ද වේ.

ටී. බී. සුබසිංහ,
කර්මාන්ත හා විද්‍යා කටයුතු භාර ඇමති.

1970 දෙසැම්බර් 28දින,
කොළඹ දීය.

## උපලේඛනය

1. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොලොන්නාව පළාත් ආණ්ඩු සභා සීමාව තුල අඹතලෙන් පහළ එගොඩ කොලොන්නාවේ පිහිටි, උතුරට හා නැගෙනහිරට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රයෝජනයට ගන්නා ඉඩමෙන්ද, දකුණට (කොළඹ වරාය කොමිෂන් සභාව) පාරකට වෙන්කල ඉඩමෙන් හා බටහිරට බ්‍රිටිෂ් පෙට්‍රෝලියම් සමාගමට බදුදී ඇති ඉඩමෙන් ද මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් දහඅටක් (අ. 1, රූ. 1, ප. 18) වූ එසෝ ස්ටෑන්ඩඩ් ඉන්කෝපරේටඩ් සමාගමට බදු දී තිබූ කොළඹ වරාය කොමිෂන් සභාව සතු කොලොන්නාව තෙල් ගබඩාවේ අනතුරු රහිත භූමි භාගයට අයත් රජයට හිමි සම්පූර්ණ බිම් කොටසය.

(කොලොන්නාව—එසෝ)

2. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොලොන්නාව පළාත් ආණ්ඩු සභා සීමාව තුල අඹතලෙන් පහළ එගොඩ කොලොන්නාවේ පිහිටි උතුරට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට බදු දී ඇති ඉඩමෙන් හා (කොළඹ වරාය කොමිෂන් සභාව) පාරකට වෙන්කල ඉඩමෙන්ද, නැගෙනහිරට ලංකා ඛනිජ තෙල් සංස්ථාවට බදු දී තිබූ දැනට ලංකා ෂෙල් සමාගමේ ප්‍රයෝජනයට ගන්නා ඉඩමෙන්ද, දකුණට හා බටහිරට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට බදු දී ඇති ඉඩමෙන්ද මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර නැත, රූඩ් දෙකයි, පර්චස් විස්සක් (අ.0, රූ. 2, ප.20) වූ සීමාසහිත ලංකා තෙල් සමාගමට බදු දී ඇති කොළඹ වරාය කොමිෂන් සභාට සතු කොලොන්නාව තෙල් ගබඩාවේ අනතුරු සහිත භූමි භාගයට අයත් රජයට හිමි සම්පූර්ණ බිම් කොටසය.

(කොළොන්නාව—ෂෙල්)

3. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ මහ නගර සභා සීමාව තුල බ්ලුමැන්ඩෝල්හි පිහිටි, උතුරට පෞද්ගලික අය විසින් හිමිකම් කියන ඉඩමෙන්ද නැගෙනහිරට පෞද්ගලික ඉඩමකින් හා රජය (කොළඹ වරාය කොමිෂන් සභාව) සතු ඉඩමෙන්ද දකුණට රජය (කොළඹ වරාය කොමිෂන් සභාව) සතු ඉඩමෙන්ද, එසෝ ස්ටෑන්ඩඩ් ඊස්ටන් ඉන්කෝපරේටඩ් සමාගමට බදු දී ඇති ඉඩමෙන් ද ලංකා ෂෙල් සමාගමට බදු දී ඇති ඉඩමෙන් හා බටහිරට ලංකා ෂෙල් සමාගමට බදු දී ඇති ඉඩමෙන් හා රජය (කොළඹ වරාය කොමිෂන් සභාව) සතු ඉඩමෙන්ද මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර දෙකයි, රූඩ් නැත, පර්චස් අටයි දශම හතරයි සතරක් (අ. 2, රූ. 0, ප. 8.44) වූ බ්ලුමැන්ඩෝල්හි බ්‍රිටිෂ් පෙට්‍රෝලියම් සමාගමට බදු දී ඇති කොළඹ වරාය කොමිෂන් සභාව සතු බ්ලුමැන්ඩෝල්හි යන්ත්‍රස්ථානයේ මිනුම් තඩාගවලින් කොටසක් පිහිටි රජය සතු සම්පූර්ණ බිම් කොටස.

(බ්ලුමැන්ඩෝල්—ෂෙල්)

4. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ මහ නගර සභා සීමාව තුල බ්ලුමැන්ඩෝල්හි පිහිටි උතුරට පෞද්ගලික අය විසින් හිමිකම් කියන ඉඩමෙන් හා රජය (කොළඹ වරාය කොමිෂන් සභාව) සතු ඉඩමෙන් හා බ්‍රිටිෂ් පෙට්‍රෝලියම් සමාගමට බදු දී ඇති ඉඩමෙන්ද, නැගෙනහිරට රජය (කොළඹ වරාය කොමිෂන් සභාව) සතු ඉඩමෙන් හා බ්‍රිටිෂ් පෙට්‍රෝලියම් සමාගමට බදු දී ඇති ඉඩමෙන්ද, දකුණට (කොළඹ වරාය කොමිෂන් සභාව) පාරකට වෙන් කල ඉඩමෙන්ද, බටහිරට වෝල්ස් පටුමගෙන් හා පෞද්ගලික අය විසින් හිමිකම් කියන ඉඩමෙන්ද මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර තුන යි, රූඩ් නැත, පර්චස් හතරයි දශම හයයි හතක් (අ. 3, රූ.0, ප. 4.67) වූ ලංකා ෂෙල් සමාගමට බදු දී ඇති, කොළඹ වරාය කොමිෂන් සභාව සතු බ්ලුමැන්ඩල් යන්ත්‍රස්ථානයේ මිනුම් තඩාගවලින් කොටසක් පිහිටි රජය සතු සම්පූර්ණ බිම් කොටසය.

(බ්ලුමැන්ඩල්—ෂෙල්)

5. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ නගර සභා සීමාව තුල බ්ලුමැන්ඩෝල්හි පිහිටි උතුරට බ්‍රිටිෂ් පෙට්‍රෝලියම් සමාගමට බදු දී ඇති ඉඩමෙන් හා ලංකා ෂෙල් සමාගමට බදු දී ඇති ඉඩමෙන්ද, නැගෙනහිරට බ්‍රිටිෂ් පෙට්‍රෝලියම් සමාගමට බදු දී ඇති ඉඩමෙන් හා රජය (කොළඹ වරාය කොමිෂන් සභාව) සතු ඉඩමෙන්ද, දකුණට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට බදු දී ඇති ඉඩමෙන් හා රජය (කොළඹ වරාය කොමිෂන් සභාව) සතු ඉඩමෙන්ද, බටහිරට ලංකා ෂෙල් සමාගමට බදු දී ඇති ඉඩමෙන් හා (කොළඹ වරාය කොමිෂන් සභාව) පාරකට වෙන් කල ඉඩමෙන්ද, මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර එකයි, රූඩ් නැත, පර්චස් දොළහයි දශම හතරයි දෙකක් (අ. 1, රූ.0, ප. 12.42) වූ එසෝස්ටෑන්ඩර්ඩ් ඉන්කෝපරේටඩ් සමාගමට බදු දී ඇති, කොළඹ වරාය කොමිෂන් සභාව සතු බ්ලුමැන්ඩෝල් යන්ත්‍රාස්ථානයේ මිනුම් තඩාගවලින් කොටසක් පිහිටි රජය සතු සම්පූර්ණ බිම් කොටසය.

(බ්ලුමැන්ඩෝල්—එසෝ)

6. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ නගර සහා සීමාව තුල මෝදර දකුණු ජෙටියේ පිහිටි, උතුරට හා නැගෙනහිරට රජය (කොළඹ වරාය කොමිෂන් සභාව) සතු ඉඩමෙන්ද, දකුණට කැල්ටෙක්ස් සමාගමේ ප්‍රයෝජනයට ගන්නා ගොඩනැගිල්ලෙන් හා රජය (කොළඹ වරාය කොමිෂන් සභාව) සතු ඉඩමෙන්ද, බටහිරට රජය (කොළඹ වරාය කොමිෂන් සභාව) සතු ඉඩමෙන්ද මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර නැත, රූඩ් නැත, පර්චස් එකයි දශම එකයි හතරක් (අ.0, රූ.0, ප. 1.14) වූ ලංකා ෂෙල් සමාගමේ ප්‍රයෝජනයට ගන්නා දෙමහල් ගොඩනැගිල්ලකින්ද යුත් කොළඹ වරාය කොමිෂන් සභාව සතු රජයට හිමි සම්පූර්ණ බිම් කොටසය.

(දකුණු ජෙටිය—ෂෙල්)

(එල්ඒ/ඒ/105—නැව් තෙල් සැපයීමේ පහසුකම්)
(සා. අ. අංක 90)

12—1353/2

---

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### සතුකිරීමේ ආඥාව

1963 අංක 5 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (සංශෝධන) පනතින් සංශෝධිත 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 35 වෙනි වගන්තියෙන් මාවෙත පැවරී ඇති බලතල ප්‍රකාර කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමති, ටිකිරි බණ්ඩා සුබසිංහ වන මම මෙම නියෝගයෙන් 1970 දෙසැම්බර් 29 වන දින සිට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු කරමි.

මෙම උපලේඛනයේ විස්තර කරනු ලබන බිම් කොටසේ තිබෙන හෝ එහි දක්නට ලැබෙන සියලුම නැව් ලිහිසි තෙල් සහ ග්‍රීස් වර්ග නාවික යාත්‍රාවලට අයත් උපකරණ සහ ඒවායේ වැඩිපුර අමතර කොටස් ද වේ.

ටී. බී. සුබසිංහ,
කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමති.

1970 දෙසැම්බර් මස 28 දින,
කොළඹ දීය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොලොන්නාව නගර සභා සීමාව තුල අඹතලෙන් පහල එගොඩ කොලොන්නාවේ පිහිටි උතුරට බ්‍රිටිෂ් පෙට්‍රෝලියම් සමාගමට බදු දී ඇති ඉඩමෙන්ද, නැගෙනහිරට එසෝ ස්ටෑන්ඩට් ඊස්ටන් ඉන්කෝපරේටඩ් සමාගමට බදු දී ඇති ඉඩමෙන්ද, දකුණට (කොළඹ වරාය කොමිෂන් සභාව) පාරකට වෙන්කල ඉඩමෙන්ද, බස්නාහිරට බ්‍රිටිෂ් පෙට්‍රෝලියම් සමාගමට බදු දී ඇති ඉඩමෙන්ද මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් හතරක් (අ. 1, රූ. 1, පර්. 4) වූ බ්‍රිටිෂ් පෙට්‍රෝලියම් සමාගමට බදු දී ඇති කොළඹ වරාය කොමිෂන් සභාව සතු කොලොන්නාව තෙල් ගබඩාවේ අනතුරු රහිත කොටසක පිහිටි රජය සතු සම්පූර්ණ බිම් කොටස.

(නැව්තෙල් සැපයීමේ පහසුකම්—ෂෙල්),

(එල්ඒ/ඒ/105),
(ස.ආ.—91).

12-1353/3

---

## ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව

### සතුකිරීමේ ආඥාව

1963 අංක 5 දරණ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත 1961 අංක 28 දරණ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා පනතේ 35 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමති ටිකිරි බණ්ඩා සුබසිංහ වන මම මෙම නියෝගයෙන් 1970 දෙසැම්බර් 29 වන දින සිට ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සතු කරමි.

(1) කොළඹ වරාය තුළ නැව්තෙල් සැපයීම සඳහා යොදවන ලොයිඩ්ගේ නැව් නාම ලේඛනවල අංක 5252567 සහ නිල අංක ඇල් 126 යටතේ ලියා පදිංචි කර ඇති (පීබීඑච්ජේ සංඥ සළකුණ දරණ) නිල්වලා යනුවෙන් නම් කර ඇති මුහුදු යාත්‍රාව සහ ඊටම අයත් එය තුල තැන්පත් වී ඇති සහ ඒ සඳහාම ගොඩ බිමෙහි ගබඩාවල රඳවා ඇති සියලු වැඩිපුර සහ අමතර කොටස්.

(2) කොළඹ වරාය තුළ නැව්තෙල් සැපයීම සඳහා යොදවන ලොයිඩ්ගේ නැව් නාම ලේඛනවල අංක 5394987 හා නිල අංක ඇල් 31 යටතේ ලියා පදිංචි කර ඇති යැන්ඔය යනුවෙන් නම් කර ඇති මුහුදු යාත්‍රාව සහ ඊටම අයිති එය තුලම තැන්පත්වී ඇති සහ ඒ සඳහාම ගොඩබිමෙහි ගබඩාවල රඳවා ඇති සියලු අමතර සහ වැඩිපුර කොටස්.

(3) කොළඹ වරාය නැව්තෙල් සැපයීම සඳහා යොදවන නිල අංක ඇල් 29 යටතේ ලියා පදිංචි කර ඇති කලුඔය යනුවෙන් නම් කර ඇති මුහුදු යාත්‍රාව සහ ඊටම අයත් එය තුළ තැන්පත් වී ඇති සහ ඒ සඳහාම ගොඩබිමෙහි ගබඩාවල රඳවා ඇති සියලු අමතර සහ වැඩිපුර කොටස්ද එසේම මෙකී යාත්‍රාවේ සවිකිරීමේ අදහසින් මිලදී ගන්නා ලද හෝ ආනයනය කරන ලද හෝ සියලු උපකරණ සහ අමතර වැඩිපුර කොටස්.
(ෂෙල් නැව්තෙල් යාත්‍රා)

(4) කොළඹ වරාය තුල නැව්තෙල් සැපයීම සඳහා යොදවන බෝට්ටු අංක ඇල් 104 දරණ අංක ඒ 79276 බල පත්‍ර සහතිකය සහ අංක එච්/30/70 දරණ රක්ෂණ ඔප්පුවේ ආවරනය සහිත එසෝ 841 යනුවෙන් නම් කර ඇති ලෝන්ච් යාත්‍රාව සහ ඊටම අයිති එය තුල තැන්පත්වී ඇති සහ ඒ සඳහාම ගොඩබිමෙහි ගබඩාවල රඳවා ඇති සියලු අමතර හා වැඩිපුර කොටස්.
(එසෝ ලොන්ච් යාත්‍රාව).

ටී. බී. සුබසිංහ,
කර්මාන්ත සහ විද්‍යා කටයුතු ඇමති.

1970 දෙසැම්බර් 28,
කොළඹදීය,

(එල්ඒ/ඒ/105—නැව්තෙල් යාත්‍රා සහ ලෝන්ච් යාත්‍රා),
(ස.ආ.—93).

12-1353/4.

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### සතුකිරීමේ ආඥාව

1963 අංක 5 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (සංශෝධන) පනතින් සංශෝධිත 1961 අංක 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 35 වෙනි වගන්තියෙන් මවෙත පැවරී ඇති බලතල ප්‍රකාර කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමති, ටිකිරි බණ්ඩා සුබසිංහ වන මම මෙම නියෝගයෙන් 1970 දෙසැම්බර් 29 වන දින සිට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු කරමි.

(1) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු චීනවරාය තෙල් ගබඩාවේ පිහිටි අංක 2, 7, 9 සහ 10 දරණ තඩාගයන්හි අඩංගු හෝ ඒවායේ දක්නට තිබෙන සියලුම ඛනිජ තෙල් නිශ්පාදන වර්ග.

(2) ත්‍රිකුණාමල වරායේ සිට, මෙම උපලේඛනයේ අංක 1 දරණ කොටසෙහි විස්තර වන එක් එක් තඩාගයන් දක්වා අංක 1 තෙල් ජෙටියෙන් විහිදී ඇති නල මාර්ගවල අඩංගු සහ ඒවායේ දක්නට තිබෙන සියලුම ඛනිජ තෙල් නිශ්පාදන වර්ග.

1970 දෙසැම්බර් 28 වැනි දින,
කොළඹ දී ය.

ටී. බී. සුබසිංහ,
කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමති

(චීනවරාය—ඛනිජ තෙල් නිශ්පාදන)
(එල්ඒ/ඒ/105)
(ස : ආ—92)

12–1353/5

---

## ලංකා ඛනිජ තෙල් නීතිගක සංස්ථාව

### සතුකිරීමේ ආඥාව

1963 අංක 5 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (සංශෝධන) පනතින් සංශෝධිත 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 35 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමති, ටිකිරි බණ්ඩා සුබසිංහ වන මම මෙම නියෝගයෙන් 1970 දෙසැම්බර් 29 වන දින සිට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු කරමි.

කොලොන්නාව තෙල් ගබඩාවේ භූමි භාගයේ අනතුරු රහිත කොටසක පිහිටි සීමාසහිත ලංකා ෂෙල් සමාගමට අයත් බන්ධිත ගුදම්වල අඩංගු සහ ඒවායේ දක්නට තිබෙන සියලුම නැව් ලිහිස්සි තෙල් සහ ග්‍රීස් වර්ග.

1970 දෙසැම්බර් 28 වැනි දින,
කොළඹ දී ය.

ටී. බී. සුබසිංහ,
කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමති.

(ෂෙල්—නැව් ලිහිස්සි තෙල්)
(සා. අ. 94—එල්ඒ/ඒ/105)

12–1353/6

---

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### සතුකිරීමේ ආඥාව

1963 අංක 5 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (සංශෝධන) පනතින් සංශෝධිත 1961 අංක 28 දරණ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 35 වෙනි වගන්තියෙන් මවෙත පැවරී ඇති බලතල ප්‍රකාර කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමති, ටිකිරි බණ්ඩා සුබසිංහ වන මම, මෙම නියෝගයෙන් 1970 දෙසැම්බර් 29 වන දින සිට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු කරමි.

(1) මෙහි උපලේඛනයේ විස්තර කරනු ලබන දේපලෙහි තිබෙන හෝ දක්නා සියලුම චංචල හා නිශ්චල දේපල.

(2) මෙහි උපලේඛනයේ විස්තර කරනු ලබන දේපල සම්බන්ධව එකඟවීමකින් විධිමත් හෝ අනියම් ගිවිසුමකින් හෝ බද්දකින් හෝ නොතාරිස් සහතික ඇති නීත්‍යානුකූල ලියවිල්ලකින් 1970 දෙසැම්බර් 22 වන දින සාමූහික හෝ ඒකීය වශයෙන් පවතින සෑම අයිතිවාසිකම්, සම්බන්ධකම් හා ප්‍රයෝජන ද වේ.

ටී. බී. සුබසිංහ,
කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමති.

1970 දෙසැම්බර් 28 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ කොලොන්නාව පළාත් ආණ්ඩු සභා සීමාව තුල, අඹතලෙන් පහළ එගොඩ කොලොන්නාවේ පිහිටි උතුරට සීමාසහිත ලංකා ෂෙල් සමාගමට බදු දී තිබූ තෙල් ගබඩා ස්ථානයේ කොටසකින් හා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට බදු දී තිබූ එම ඉඩමේ කොටසකින්ද, නැගෙනහිරට ෂෙල් සමාගමට බදු දී තිබූ දැනට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රයෝජනයට ගන්නා එම ඉඩමේ කොටසකින් හා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට බදු දී ඇති එම ඉඩමේ කොටසකින්ද, දකුණට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට බදු දී ඇති ඉහත කී ඉඩමේ කොටසකින්ද, ලංකා ෂෙල් සමාගමට අයිති කාර්යාලයීය ගොඩනැගිල්ලෙන්ද, ලංකා ෂෙල් සමාගමට බදු දී ඇති ඉහත කී ඉඩමේ කොටසකින්ද, ලංකා ෂෙල් සමාගමට අයිති ගරාජ් ගොඩනැගිල්ලෙන්ද ලංකා ෂෙල් සමාගමට බදු දී ඇති ඉහත කී ඉඩමේ ඉතිරි කොටසින්ද, බස්නාහිරට දුම්රිය මාර්ග සඳහා වෙන් කර ඇති ඉඩමෙන් හා සීමාසහිත ලංකා ෂෙල් සමාගමට බදු දී ඇති ඉහත කී ඉඩමේ කොටසකින්ද මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර නැත, රූඩ් දෙකයි, පර්චස් දහතුනයි (අක්. 0, රූඩ් 2, පර්. 13) වූ ඉටිපන්දම් කර්මාන්ත ශාලාව හා ජල සිසිල ස්ථම්භයද පිහිටි කොළඹ වරාය කොමිෂන් සභාව සතු කොලොන්නාව තෙල් ගබඩාවේ කොටසක පිහිටි අනතුරු රහිත භූමි භාගයට අයත් රජයට හිමි සම්පූර්ණ බිම් කොටස.

(ඉටිපන්දම් කම්හල—එල්ඒ/ඒ/106)

(ස ආ 89)

12–1353/7

---

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රපිතයි